
## කවරයේ කතාව




# හොඳට - නරකට දෙකට

# රූපවාහිනිය

**පියදස රත්නසිංහ**

ලංකාවට ම රූපවාහිනිය හඳුන්වා දී අවුරුදු දෙකකින්, ඒ කියන්නේ 1984 අවුරුද්දේ කොළඹ ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී විද්වත් මණ්ඩලයකගේ සහාගීත්වයෙන් දෙදින සම්මන්ත්‍රණයක් පැවැත්විණි. මෙහි මැය වූයේ "රූපවාහිනිය හා අපරාධ" (TVS Violence)යන්න යි. එහි දී දේශකයෝ දහ හතරදෙනෙක් සත්දර්ශනාත්මක පත්‍රිකා ඉදිරිපත් කළහ. සම්මන්ත්‍රණය අවසානයේ කාර්ය සැසි කිහිපයක් පවත්වා විෂය පිළිබඳ නිර්දේශ මාලාවක් ද ඉදිරිපත් කරන ලදි. රූපවාහිනී මාධ්‍යයේ ඇති ප්‍රබලතාව තේරුම් ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් වෙනත් රටවල මෙන් අයහපත් ප්‍රතිඵල උදවීමට පෙර පිළියම් යෙදීමේ අභිලාෂයෙන් එකී සම්මන්ත්‍රණය පැවැතවුවත් ඉන් එහාට කිසිදු පියවරක් ගත් බවක් නොදනිමු.

ඒ වන විට රූපවාහිනිය හඳුන්වා දී කෙටි කාලයක් වූ හෙයින් රූපවාහිනී වැඩ සටහන් ප්‍රචණ්ඩත්වයට හා අපරාධවලට කෙතෙක් දුරට ඉවහල් වී දැයි තීරණය කිරීම අපහසු ය. එහෙත් විද්‍යාර්ථීන් ගේ වගකීම වන්නේ ඒ පිළිබඳව අවදියෙන් සිට විධිමත්ව සමීක්ෂණය කිරීම බවත් ඉන් අවධාරණය කරන ලදී. රූපවාහිනිය අරඹා අවුරුදු 20 ක් ඉක්ම ගොස් ඇතත් එවන් පර්යේෂණයක් කළ බවක් තවම පෙනෙන්නට නැත. ඉඳහිට පුවත්පත්වල විෂයයට අදාළ ලිපි පළ වුවත් අපරාධ වලට රූපවාහිනී වැඩසටහන් සෘජුව හෝ වෙනත් අනියම් අයුරකින් බලපා ඇති බවට හේතු සාධක දත්ත ඇතිව කරුණු දැක්වීමක් සිදුවී නැතැයි කීම නිවැරදි ය.

අති පූජ්‍ය මඩිහේ නාහිමියෝ ද මේ ගැන නිරන්තරයෙන් මතක් කර සිටිති. අලුත් දෙයක් හඳුන්වා දෙන විට විරෝධතා ඇති වීම අසාමාන්‍ය දෙයක් නොවන බව අතීත සිද්ධි සිහිපත් කරන විට පෙනී යයි. මුලින් ම දුම්රිය හඳුන්වා දීමෙන් පසු පැයට සැතපුම් 12 ක වේගයෙන් දුවද්දී "මිනී මරුවෙක් පාරට දමලා" කියමින් අදහස් ඉදිරිපත් වී ඇත. ඒ නිසාම රේල්ලුව ඉදිරියෙන් රතු කොඩියක් අරගෙන කෙනෙකුට දිවීමට සිදුව තිබේ. පුවත්පත් හා සම්බන්ධ මුද්‍රණ ශිල්පය හඳුන්වා දුන් අවස්ථාවේ එක්තරා පන්තියකට පමණක් සීමා වූ දැනීම කාටත් දෙන්න යන බවට විවිධ අදහස් ඉදිරිපත් විණි. ලෝකයේ විවිධ මතිමතාන්තර සැමගේ ම කතා බහට ලක් කිරීමට දීම භයානක බව ද, එය වඳුරන්ට දැලිපිහිය දුන්නා වගේ යැයි ද ඔවුහු සඳහන් කර සිටියහ.

ගුවන් විදුලිය පිළිබඳව ද විරෝධතා ආකල්ප ඇතිවී තිබිණ. එහෙත් අද එය ඉතා ප්‍රබල මාධ්‍ය මෙහෙවරක් සිදු කරයි. රූපවාහිනිය මේ සියල්ලටම වඩා ප්‍රබල මාධ්‍යයක් බවට පත්වීම නිසාම එහි ප්‍රබලතාවලට වඩා දුබලතා ගැන අවධානය එද සිට ම ඒ කෙරේ යොමුව පැවතිණ.

රූපවාහිනී වැඩ සටහන් අපරාධ හා ප්‍රචණ්ඩත්වයට හෙවනැල්ලක් වී තිබේ ද? විවිධ සමීක්ෂණ වලින් උකහා දක්වන අපරාධ රූපවාහිනී අනුකරණය නිසා ම සිදුවේ ද? මීට පෙර ලොව අපරාධ, දූෂණ, බාලාපචාර, ස්ත්‍රී දූෂණ හා වෙනත් ප්‍රචණ්ඩත්වයක් සිදු නොවූයේ ද? ප්‍රාග් ඓතිහාසික යුගවල පටන් ම ප්‍රචණ්ඩත්වය මූර්තිමත් වන කතා එමට තිබුණි. මුල්ම කාල වලට අයත් වන ගුහා සිතුවම්වල පවා බියකරු අමානුෂික පුද්ගලයන් පිළිබඳව දක්නට ලැබේ. අංගුලිමාල කතාවේ ප්‍රචණ්ඩත්වය ඇඟිලි කැපීම නොවේ ද? මිසරයේ දෙවියකු වූ ඔසිරිස් ඔහු ගේ මව ගේ නියමය මත කපා කොටා මරා දමා ඇත. ග්‍රීක ප්‍රවාද කතා වුවත් ප්‍රචණ්ඩත්වයෙන් මිදී නැති බව අපට ඉන් පෙනී යයි. මහා කවි හෝමර් ගේ "ඔඩිසි"(Odyssey) කාව්‍යයේ රජතුමා තම බිසව දරුවා හා මව පීඩනයට ලක් කළවුත් මරා දැමූ අයුරු අපූරුවට දක්වෙයි.

ඉංග්‍රීසි වේදිකාවේ බොහෝ විට ප්‍රචණ්ඩත්වය විදහා දැක්වූ වගට සාධක එමට ය. ඉරානයේ ෂා රජු විසින් ෂේක්ස්පියර් ගේ හැම්ලට් හා මැක්බත් තහනම් කරන ලද්දේ කවරකු විසින් හෝ රජ මරා දැමීමට








*රූපවාහිනී වැඩ සටහන් අපරාධ හා ප්‍රචණ්ඩත්වයට හේතුවක් වී තිබේ ද? විවිධ සමීක්ෂණ වලින් උකහා දක්වන අපරාධ රූපවාහිනී අනුකරණය නිසා ම සිදුවේ ද? මීට පෙර ලොව අපරාධ, දූෂණ, බාලාපචාර, ස්ත්‍රී දූෂණ හා වෙනත් ප්‍රචණ්ඩත්වයක් සිදු නොවූයේ ද?*

මුල්විය හැකි යැයි යන අනුමානය නිසා ය. ගොතේ (Johann Woifgang Von Goethe) ගේ Die Leiden des Junger Werlher නම් කෘතිය සියදිවි නසා ගැනීම සඳහා හේතු කාරක වේ යැයි සමහර රටවල තහනමට ලක් වී තිබේ.

සිනමාව පිළිබඳ කතාන්තරයේ භීෂණය, මිනී මැරුම්, ස්ත්‍රී දූෂණ දුරාචාරයන් පිළිබඳ උපුටනයන් කොතෙකුත් දක්වීමට පුළුවන.

ප්‍රස්තුත මාතෘකාව වන්නේ අදට ප්‍රබල, නිතර ඇස ගැසෙන රූපවාහිනී මාධ්‍යයෙන් ප්‍රචණ්ඩත්වයට හා අපරාධ වලට පෙළඹවීමක් කෙරේ ද යන්න ය. 1984 වර්ෂයේ (NCTV) වාර්තාවකට අනුව ඇමරිකාවේ පමණක් වර්ෂයකට මිනී මැරුම් 10000 ක් හා මිනී මැරුම්වලට දරන ප්‍රයත්නයන් 60000 ක් ප්‍රදර්ශණය කෙරිණි. රූපවාහිනිය අපරාධවලට හේතු කාරක වන්නේ දැයි නිර්ණය කිරීමට අංශ කිහිපයකින් අවධානය යොමු කළ යුතු වේ.

01. කොපමණ අපරාධ/ දුරාචාර ප්‍රචණ්ඩ ක්‍රියා ඇස ගැසෙනවා ද?

02. විෂයාත්මක අධ්‍යයනයන් මගින් අනාවරණය කරගන්නා තොරතුරු.

03. විෂය පිළිබඳ විද්වතුන් විසින් කරනු ලබන අධ්‍යයනයන්. ප්‍රබන්ධ හේතුවන්නේ කුමන මිම්මකින් ද?

එය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් විය හැකි ය. මාධ්‍ය වේදියකු වන ගර්බ්නර් (Gerbner) කෙනෙකු සහේතුකව තුවාල කිරීමට මරණයට පත්කිරීමට හෝ ශාරීරික හිංසනයට ලක්කිරීමට තම ශාරීරික ශක්තිය/ බලය යෙදවීම ප්‍රචණ්ඩත්වය බව අර්ථ කථනය කර ඇත. භීෂණ දර්ශනය දිවෙන කාලය තුළ භීෂණ එකක් හෝ වැඩි සංඛ්‍යා සිදු විය හැකි ය.

රූපවාහිනිය හෝ සිනමාවේදී හිංසාකාරී ප්‍රචණ්ඩ දසුන් දැකීමෙන් ඒවා අනුකරණය කිරීම පිළිබඳව විවිධ අවස්ථා ඉදිරිපත් කර ඇත. එවැනි එක් අවස්ථාවකි 1993 මහා බ්‍රිතාන්‍යයේ ජේම්ස් බුල්ගර් (James Bulger) නමැති කුඩා දරුවා, දස හැවිරිදි ළමයින් දෙපලක් විසින් මරණයට පත් කිරීම.


මේ පිළිබඳ නඩු තීන්දුවේ දී විනිසුරුවරයා අවධාරණය කර ඇත්තේ මිනී මැරුමට සම්බන්ධ දරුවන් දෙපලගෙන් එක් අයෙකු ගේ පියා විසින් ගෙන ආ ත්‍රාසජනක චිත්‍රපටියක් දැකීමෙන් (Horror Film) පොළඹවනු ලැබ ඇති බවකි. එහෙත් මේ පිළිබඳ සාක්ෂි විභාග කළ පොලිස් සුපිරින්ඩැන්ඩන්ට් වරයා විසින් පවසන ලද්දේ ඒ බවට සාක්ෂි නැති බව ය. මේ පිළිබඳව බ්‍රිතාන්‍යයේ පාර්ලිමේන්තුවේ මහත් ආන්දෝලනයක් ඇති විය.

ඒ නිසා ස්කයි රූපවාහිනී සේවයේ (Sky TV) විකාශය වීමට තිබූ එම චිත්‍රපටය අවලංගු කිරීමට සිදු විණි. එහෙත් මෙයට පෙර දෙවරක් බ්‍රිතාන්‍යයේ රූපවාහිනී මගින් එය විකාශය වී තිබූ බව ද අමතක නොකළ හැකි ය.

එම චිත්‍රපටයෙන් දැක්වූයේ ළමයින් දෙදෙනකු විසින් බෝනික්කකු පැහැරගෙන ගොස් අවතාර දුම්රියක දී මරණයට පත් කළ දර්ශනයකි. ජර්මනියේ මානසික වෛද්‍යවරයකු විසින් කරන ලද පර්යේෂණයක දී තවත් එබඳු අවස්ථාවන් සොයාගෙන ඇත. වයස අවුරුදු දෙළහක් වූ ගැහැනු ළමයි දෙදෙනෙක් ඔවුනට විවේක ලැබුණු බොහෝ වේලාවල චිත්‍රපට නැරඹීමට පුරුදු වී සිටියහ. එයින් සෑහීමට පත් නොවූ මේ දෙදෙනා එය අත්හදා බැලීමට ද පටන් ගත්හ. ඔවුන් විසින් අසල්වැසි ගෙදරක කුඩා දරුවකු මරා දමන ලද්දේ එහි ප්‍රතිඵලයක් ලෙසින් බව අනාවරණය විණි.

1989 වසරේ අගෝස්තු මාසයේ 27 හැවිරිදි ජපන් ජාතික චිත්‍ර ශිල්පියකු වූ ත්සුමෝ මියාසකි විසින් තරුණ ගැහැනු ළමයින් දෙදෙනකු මරාදැමූ බවත්, ඔවුන් ගේ සිරුරු වළ දැමීමට පෙර රූපගත කළ බවත් ඔහු විසින් පිළිගෙන ඇත. ඔහු ගේ නිවස පරීක්ෂා කිරීමේ දී වීඩියෝ පට 6000 ක් පමණ සොයාගත් බවත් අනාවරණය වී ඇත. මියාසකි ගේ කාමරයෙන් සොයාගත් (A Flower of Blood And Flesh) නමැති ත්‍රාසජනක ජපන් චිත්‍රපටයෙන් තරුණ ගැහැනු ළමයකු මරා ඇගේ ලේ වලින් චිත්‍රයක් අඳින අයුරු විදහා දැක්වෙන අවස්ථාවක් අනාවරණය වී ඇත. මේ පිළිබඳව, විග්‍රහ කරන (Keio)විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ඔකොනොගී (Okonogi) කියන්නේ මෙම චිත්‍ර ශිල්පියා අතින් මරණයට පත්වූවන් තමන් දුටු චිත්‍රපටවල එන බෝනික්කන් හෝ චරිත සේ සලකන්නට ඇති බව ය.

මියාසාකි ගේ සිද්ධියට පමණක් මේ දේවල් සීමා වී නොමැත. මෙහි දී(Asian wall Street Journal) සඟරාවේ දක්වා ඇති සිද්ධියක් උපුටා දැක්විය හැකි ය. පොලිස් වාර්තාවකට අනුව උසස්





වයස අවුරුදු දෙළහක් වූ ගැහැනු ළමයි දෙදෙනෙක් ඔවුනට විවේක ලැබුණු බොහෝ වේලාවල චිත්‍රපට නැරඹීමට පුරුදු වී සිටියහ. එයින් සෑහීමට පත් නොවූ මේ දෙදෙනා එය අත්හදා බැලීමට ද පටන් ගත්හ. ඔවුන් විසින් අසල්වැසි ගෙදරක කුඩා දරුවකු මරා දමන ලද්දේ එහි ප්‍රතිඵලයක් ලෙසින් බව අනාවරණය විණි.

බාලිකා විද්‍යාලයක පාසල් දැරියක බලහත්කාරයෙන් පැහැරගෙන ගොස් දූෂණය කර දැඩි මානසික හා කායික හිංසනයට පත් කළ බවත්, අනාවරණය වී ඇත. වින්තිකරුවන් විසින් පිළිගනු ලැබූ මෙවැනි බිහිසුණු අපරාධ කිරීමට ඔවුන් පෙලඹී ඇත්තේ වැඩිහිටියන් සඳහා වූ වීඩියෝ පට නැරඹීමෙන් බව ඔප්පු වී ඇත. එපමණක් ද නොව ස්ත්‍රී දූෂණ සඳහා පෙලඹී ඇත්තේ වැඩිහිටියන් සඳහා වූ වීඩියෝ පට ද චිත්‍රපට දර්ශන ද නැරඹීමෙන් බව අනාවරණය වී ඇත.

1984 දී අගනුවර පැවති සමුළුවක දී මේ ගැන අනාවැකි හා විවිධ අදහස් ඉදිරිපත් වූවත් රූපවාහිනිය අපරාධ වලට ඉවහල් වන බවට තොරතුරු හා දත්ත ඉදිරිපත් කිරීමට තරම් එවකට ශ්‍රී ලංකාවේ රූපවාහිනී වැඩසටහන් බලපෑමක් වී නොතිබුණි. එහෙත් ඇතැම් චිත්‍රපට විකාශය සම්බන්ධයෙන් වේලාවක් නියම කළ යුතු බවට එකඟතාවක් තිබුණි. විශේෂයෙන් වැඩිහිටි තේමාවන් රැගත් චිත්‍රපට ප්‍රදර්ශණය රාත්‍රී ඉංග්‍රීසි ප්‍රවෘත්ති ප්‍රචාරයෙන් පසුව පෙන්විය යුතු බව එක් තීරණයක් විණි.

1983 කලබලකාරී වකවානුවේ පෙන් වූ චිත්‍රපටයකි (The Disaster On Costline) මේ චිත්‍රපටයට පාදක වී ඇත්තේ චිකාගෝ නුවර සිදු වූ බිහිසුණු රිය අනතුරක් හා ඊට හේතු පාදක වූ සිද්ධි සමුදායකි. මේ චිත්‍රපටය නරඹමින් සිටි පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්යවරයෙකු සිය දියණිය සමග එය නැරඹීමට අපහසු වී අසුනින් නැගිට ගිය බවත් ඒ සැනෙන් ම සංස්ථා සභාපති එම්.ජේ.පෙරේරාට එය සැල කළ බවත් මගේ මතකයට එයි.

එයින් නොනැවතුන මහාචාර්යතුමා විසින් දීර්ඝ ලිපියක් සභාපතිතුමාට යොමුකර තිබිණ. මේ උදාහරණය ගත්තේ එම චිත්‍රපටයේ බිහිසුණු ත්‍රාසජනක අත්දැකීම් පිළිබඳව නොවේ. අපේ සංස්කෘතික හැඩියාව අනුව පවා එවැනි සරල චිත්‍රපටයක් වුවත් විකාශය නොවිය යුතු බව අවධාරණයට ගත් බවකි.(On the Mat) නමැති ත්‍රාසජනක දර්ශන ඇතුළත් වැඩසටහන් පමණක් පෙන් වූ පසු එය නවත්වා දමන ලෙස තීරණය විණි. එහෙත් පසු කලෙක (Dynasty) බැලීමට විශාල පිරිසක් මහත් ඕනෑකමින් සිටි බව අපි දනිමු. 1983 ඉන්දුනීසියාවේ අධ්‍යාපන අමාත්‍යවරයා වූ වාර්ඩිමන් ඕජෝනෙගෝරෝ විසින් අවධාරණය කර සිටියේ තරුණයින් හා ළමයින් තුළ ආචාරශීලී බව නුරන්වීමටත්, දඩබ්බරකම් මතුවීමටත් බොහෝ රූපවාහිනී වැඩසටහන් හේතු වී ඇති බව ය. දෙමව්පියන්ට හා වැඩිහිටියන්ට පැවරී ඇති වගකීම් පැහැර හැරීම පිළිබඳව එතුමා ඔවුනට චෝදනා නගයි.



*තිරයේ දැක්වෙන මිනීමැරුම් සංඛ්‍යාවෙන් අපරාධ ගණන් ගැනීම සාධාරණ නොවන බව තීරු රචකයකු වන එලන් ගැස්මන් පවසයි. ඔහු තවදුරටත් කියන්නේ රූපවාහිනී ප්‍රවෘත්ති වැඩසටහනක අපරාධ හා රෝමියෝ ජුලියට් හෝ කුංෆු දර්ශනයකින් දැක්වෙන්නා වූ අපරාධවල බලපෑම එකිනෙකට වෙනස් වන බව ය.*



මලයාසියාවේ ජනමාධ්‍ය අමාත්‍යවරයා 1992 දි එරට ජාතික රූපවාහිනියේ (RTM) ත්‍රාසය හා අපරාධ ඇතුළත් සියලු දර්ශන වැඩසටහන් වලින් කපා දැමීට නියෝග පනවා ඇත. ජනමාධ්‍ය අමාත්‍යාංශය රූපවාහිනී භූමි භාගයේ ම තිබීම නිසා අමාත්‍යවරයා ගේ කිට්ටු විමසුමට ලක්වීම සාමාන්‍ය සිදුවීමක් විය.

සිංගප්පූරුවේ තත්ත්වය මෙයට බෙහෙවින් ම පරස්පර වුවකි. එරට නිපදවූ හා අපනයනය කළ බොහෝ චිත්‍රපට හා බොහෝ රූපවාහිනී වැඩසටහන්වල ත්‍රාසය හා බිහිසුණු බව සාමාන්‍ය දෙයක් වී තිබුණි. ඒවායේ මිනී මැරුම්, ගැටුම්, පහරදීම් බැලීමට තරුණයන් තුළ ඇල්මක් තිබූ බව 1993 තරුණයන් 50 දෙනෙකු සමග පැවති සමීක්ෂණයක දී හෙළි වී ඇත.

මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ දී පවා සාකච්ඡා කර තිබේ. විශේෂයෙන් හොංකොංවල පෙන්වන බිහිසුණු දර්ශන ඇතුළත් රූපවාහිනී වැඩසටහන් සිංගප්පූරුවට නොගැලපෙන බවත් අවධාරණය කර ඇත. 1993 වන විට මාධ්‍යයේ බලපෑම පිළිබඳව කරන ලද අධ්‍යයනයන් අතර 5000 කට අධික සංඛ්‍යාවක් එම අපරාධ රැල්ල පිළිබඳව වූ බව අනාවරණය වේ.

මලයාසියාවේ පිනැන්ග් නුවර පාරිභෝගිකයින් ගේ සංවිධානය(CAP) රූපවාහිනී වැඩසටහන්වල බලපෑම් නිසා සිදු වූ විවිධාකාර අපරාධ පිළිබඳව 1984 කරන ලද සමීක්ෂණයකින් අනාවරණය වන තොරතුරු ද බොහෝ රටවලට පොදු බවක් දක්වයි.(Superman) නම් වැඩසටහනේ පිළිබිඹු වන ආකාරයට පියෑඹීම අත්හද බැලීමට ගිය දරුවන් අවම වශයෙන් වසරකට පස් හය දෙනෙක්වත් මියගොස් ඇත. 12 දෙනෙකු තුවාල ලබා තිබේ. මේ දරුවන් අවම වශයෙන් පැය 3 ක්වත් රූපවාහිනිය නරඹන බවත් එය පාසලේ රැඳෙන කාලයට වැඩි බවත් පෙන්වා දී ඇත. පොපායි සුපර්මෑන් වැනි වැඩසටහන් දරුවන්ට පෙන්වීම තරම් නොවන ත්‍රාසජනක වැඩසටහන් බවට නම් කර ඇත. එහෙත් ඒවා නරඹන දරුවන් විසින් කියා ඇත්තේ ඔවුන් එවැනි වැඩසටහන්වල ත්‍රාස්‍ය ක්‍රියා (Action) වලින් ප්‍රමෝදයට පත්වන බවත් ඔවුන් ඒවා ප්‍රිය කරන බවත් ය.

අපරාධ හා සාහසික දර්ශන ඇතුළත් රූපවාහිනී වැඩසටහන් නැරඹීමෙන් දරුවන් වැළැක්වීමේ පියවරක් වශයෙන් නීතිමය ක්‍රියාමාර්ගයක් ක්ලින්ටන් පාලන සමයේ දී ඇමරිකා එක්සත් ජනපදයේ ක්‍රියාත්මක කර තිබේ. ඒ අනුව ඇමරිකාවට ගෙන්වන හෝ නිපදවන අඟල් 13 ට වැඩි රූපවාහිනී යන්ත්‍රවලටV-Chip(වී-චිප්ස්) නැමැති උපකරණයක් සවිකිරීම අනිවාර්ය කර ඇත. එමගින් සාහසික ලෙස සැලකිය හැකි දර්ශන නැරඹීමෙන් වළක්වාලීමට(Blank out)මෙයට පුළුවන. මෘදුකාංගයක් මගින් කෙරෙන මේ ක්‍රියාව මගින් දෙමව්පියන් ගේ පෞද්ගලික පාලනයකින් තොරව රූපවාහිනී දර්ශන දරුවන්ට නැරඹීමට ඉඩකඩ සැලසේ. මෙවැනි උපකරණයකින් දත්ත (Rating)ලබා ගැනීමේ දී ස්වාධීන කණ්ඩායමක් ලවා සිදු විය යුතු බව රූපවාහිනී සේවාවන් පවත්වාගෙන යන අයගේ අදහසයි. මේ ක්‍රමය යටතේ කරන ලද සමීක්ෂණයකින් ඇමරිකාවේ වාණිජ රූපවාහිනී සේවාවන්වල විකාශය වන වැඩසටහන්වලින් 44% අපරාධ සාහසික දර්ශන ඇතුළත් බව රාජ්‍ය අංශයේ රූපවාහිනී සේවාවල ඇත්තේ 18% ක් බවත් කේබල් රූපවාහිනී සේවාවල 85% ක් එවැනි දර්ශන ඇතුළත් බව අනාවරණය වී ඇත.

තිරයේ දැක්වෙන මිනීමැරුම් සංඛ්‍යාවෙන් අපරාධ ගණන් ගැනීම සාධාරණ නොවන බව තීරු රචකයකු වන එලන් ගැස්මන් පවසයි. ඔහු තවදුරටත් කියන්නේ රූපවාහිනී ප්‍රවෘත්ති වැඩසටහනක අපරාධ හා රෝමියෝ ජුලියට් හෝ කුංෆු දර්ශනයකින් දැක්වෙන්නා වූ අපරාධවල බලපෑම එකිනෙකට වෙනස් වන බව ය. ඇමරිකානු චිත්‍රපට දර්ශකයන් ගේ සභාපති ජැක් වැලෙන්ටිට අනුව වී චිප්ස් ක්‍රමය අපරාධ රැල්ලට ඇති බලපෑම අවම කිරීමට යොදගත හැකි ක්ෂණික විසඳුමක් නොවේ.

ජර්මනියේ අපරාධ පිළිබඳ කොමිසමක් පත්කර ඇති අතර ඔවුන් ගේ කාර්යය වන්නේ අපරාධ පිළිබඳව හා ඒවාට හේතුකාරක පිළිබඳව සොයා බැලීමත්, මාධ්‍යයේ බලපෑම පිළිබඳ සොයා බැලීමත් ය. මේ විෂයය පිළිබඳව විවිධ අංශ වලින් හා විශාල පරාසයන් තුළ කෙරී ඇති අධ්‍යයනයන් වලින් අනාවරණය වූ තොරතුරු පිළිබඳව තවදුරටත් සොයා බැලීම රූපවාහිනීය ඉතා වේගයෙන් ව්‍යාප්ත වන අපේ වැනි රටවලට ප්‍රයෝජනවත් දෙයක් වනු ඇත. ❑